# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My Ref. } CSS/7/1/3 | ඔබේ අංකය / உனது இல / Your Ref. } | දිනය / திகதி / Date } 2019.03.27 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - 01/2019**

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන්දීමේ නිලධාරීන් වෙත,

**<u>දකුණු පළාත් සභාවේ ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කටයුතු සිදු කිරීම.</u>**

දකුණු පළාතේ කොන්ත්‍රාත්කරුවන්ගේ ගැටළු පිළිබඳව 2019 මාර්තු 14 දින ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමයේ දකුණු පළාත් ශාඛාවේ නිලධාරීන් සමඟ දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා සිදු කළ සාකච්ඡාවේදී තීරණය වූ පරිදි, දකුණු පළාත් සභාවේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී, කොන්ත්‍රාත්කරුවන්හට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී, කොන්ත්‍රාත් කටයුතු සිදු කිරීමේදී හා ගෙවීම් කිරීමේදී පහත සඳහන් නියමයන් හා උපදෙස් වලට අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

1. දකුණු පළාත් සභාවේ ආයතනවල ඉදිකිරීම් /කර්මාන්ත පිළිබඳ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී, ලංසු ඉදිරිපත් කරන කොන්ත්‍රාත්කරුවන්ට (අනුමත ලියාපදිංචි සමිති හැර) ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමයේ ලියාපදිංචිය අනිවාර්ය වන අතර ලංසු ඉදිරිපත් කිරීමේදී ලියාපදිංචිය සහතික කරන ලියවිලි ද ඉදිරිපත් කළ යුතුය.

2. සුළු හා මධ්‍ය පරිමාණ ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ලංසු ආරාධනා කිරීමේදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් මගින් මුළු පිරිවැය ඇස්තමේන්තු සීමාවන් යටතේ අදාල ශ්‍රේණි අනුව ප්‍රසම්පාදන වැඩ පිරිනැමීමට කටයුතු කළ යුතුය. (උදා - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය අනුව C6, C7, C8 යන ශ්‍රේණිවල ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්හට පමණක් එම ශ්‍රේණිවලට අදාල කොන්ත්‍රාත් ලබා දීමට කටයුතු කිරීම). මේ සම්බන්ධයෙන් 2016.09.30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 04/2016(i) හා එය පදනම් කරගෙන මා විසින් නිකුත් කර ඇති 2016.12.21 දිනැති ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 05-2016 සඳහන් උපදෙස් අනුව කටයුතු කළ යුතු බවද සඳහන් කරමි. (ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 05-2016 මේ සමඟ අමුණා ඇත).


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office } 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax } 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail } chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site } www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.

3. හදිසි ආපදා තත්ත්වයක් වැනි අවස්ථාවක විශේෂ අනුමැතිය මත හැර ප්‍රසම්පාදන කටයුතු සිදු කරන අනෙකුත් සියළුම අවස්ථාවල දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ලංසු කැඳවීම මඟින් විධිමත් ආකාරයට කොන්ත්‍රාත් ලබා දීම සිදු කළ යුතුය. අත්‍යාවශය හා හදිසි අවස්ථාවලදි සීමිත විශේෂ මිල ගණන් කැඳවීම විධිමත් පරිදි සිදුකළ යුතුය. එනම් ලියාපදිංචි තැපැල් මඟින් මිල ගණන් කැඳවීම, ප්‍රසම්පාදන කමිටුව ඉදිරියේ විවෘත කිරීම ආදිය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

4. ලංසු කැඳවීමේ දී ලංසුකරුට තිබිය යුතු සුදුසුකම් පිළිබඳව පැහැදිලිව සඳහන් කළ යුතුය. එසේම ලංසු දැන්වීම්වල සඳහන් කර ඇති සුදුසුකම් සැලකීමේදී පළමු අදියර සාර්ථකව නිම කළ ඉදිකිරීම්කරුවන්ට කොන්ත්‍රාත් ලබා ගැනීමට නොහැකි වන ලෙස සහ ඉහළ ශ්‍රේණි අයට පමණක් කොන්ත්‍රාත් ලබා ගැනීමට හැකි වන පරිදි අවශ්‍ය සුදුසුකම් ඉහළ දමා සුළු පිරිසකට පමණක් අවස්ථාව ලැබෙන පරිදි කොන්ත්‍රාත් පිරිනැමීමට කටයුතු සිදු නොකළ යුතුය.

5. ප්‍රසම්පාදන සීමා මගහැරීමට හැකිවන පරිදි එකම කර්මාන්තය කොටස්වලට බෙදා ටෙන්ඩර් ප්‍රදානය නොකළ යුතුය.

6. ඉදිකිරීම් කර්මාන්ත සඳහා කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ගෙවීමේදී නිසිපරිදි බිල්පත් ලැබෙන අනුපිළිවෙල අනුව මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. මේ සඳහා විධිමත් ගෙවීම් ලේඛනයක් නඩත්තු කළ යුතු අතර එම ලේඛනය බැලීමට කොන්ත්‍රාත්කරුවන්ට ඉඩදිය යුතුය.

02. මෙම චක්‍රලේඛ උපදෙස් අනුව ඉදිකිරීම් කර්මාන්ත සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලෙස දැනුම් දෙන අතර, මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව යටතේ පවතින සියළුම ආයතන දැනුවත් කරන ලෙසද කාරුණිකව දන්වමි. තවද සියළුම ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමේදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ නියමයන් අනුව නිවැරදිව, විධිමත්ව හා විනිවිදභාවයෙන් කටයුතු කළ යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.සී.ද සොයිසා,
ප්‍රධාන ලේකම් ,
දකුණු පළාත.

පිටපත් -

1. සහකාර විගණකාධිපති - දකුණු පළාත - දැ.ගැ.ස
2. ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දැ.ගැ.ස
3. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා / සැලසුම් හා මෙහෙයුම්) - අ. ක. ස
4. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දකුණු පළාත - දැ.ගැ.ස

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2016.12. 21 |

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) **05-2016**

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

<u>දේශීය අරමුදල් යටතේ ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන් සඳහා රුපියල් මිලියන 50 දක්වා වැඩ සඳහා ප්‍රසම්පාදනය</u>

**<u>Procurement of Works up to Rs.50 Million from Regional Contractors Under Domestic Funds</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2016(1) හා 2016.09.30 දිනැති ලිපිය හා බැඳේ. (එහි පිටපතක් මේ සමග අමුණා ඇත.)

02. එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/6 හා 2016.12.02 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

03.එමගින් දේශීය අරමුදල් යටතේ ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන් සඳහා රුපියල් මිලියන 50 දක්වා ප්‍රසම්පාදන වැඩ පිරිනැමීම පිළිබඳ උපදෙස් ලබාදී ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු වලදී ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන් සහභාගී කරවා දිරිගැන්වීම මඟින්, ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන් ඉහලට ගෙන ඒමට රජය අපේක්ෂා කරන අතර,එමඟින් ප්‍රාදේශීය වශයෙන් රැකියා අවස්ථා වර්ධනය වීම, ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන්ගේ ධාරිතා වර්ධනය, ආදායම් විෂමතාවය අඩුවීම හා කොන්ත්‍රාත් කටයුතු වල ප්‍රමාදයන් අවම වීම, ප්‍රදේශය තුළ තරඟකාරී පිරිවැය මත දේශීය සම්පත් ප්‍රයෝජනයට ගැනීම, ප්‍රාදේශීය වශයෙන් රජයේ ඉදිකිරීම් සහ අළුත්වැඩියා සඳහා වැයවන මුදලට උපරිම වටිනාකමක් ලබා ගැනීමටද බලාපොරොත්තු වන බව සඳහන් කර ඇත.

ඒ අනුව වටිනාකම රුපියල් මිලියන 50ක් දක්වා දේශීය අරමුදල් භාවිතා වන සුළු පරිමාණ ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ලංසු ආරාධනා කිරීමේදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් මඟින් පහත සඳහන් ශ්‍රේණි අනුව දැක්වෙන මුළු පිරිවැය ඇස්තමේන්තු සීමාවන් යටතේ කටයුතු කරන ලෙස දන්වා ඇත.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary — 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office — 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax — 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail — chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site — www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.

| මුළු පිරිවැය ඇස්තමේන්තුව | CIDA ශ්‍රේණිය |
|---|---|
| i) වටිනාකම රු.2,000,000.00 ට අඩු හෝ සමාන | $C_9$ |
| ii) වටිනාකම රු.5,000,000.00 ට අඩු හෝ සමාන | $C_8$ |
| iii) වටිනාකම රු.10,000,000.00 ට අඩු හෝ සමාන හා රු.5,000,000.00 ට වැඩි | $C_7$ |
| iv) වටිනාකම රු.25,000,000.00 ට අඩු හෝ සමාන හා රු.10,000,000.00 ට වැඩි | $C_6$ සහ $C_5$ |
| v) වටිනාකම රු.50,000,000.00 ට අඩු හෝ සමාන හා රු.25,000,000.00 ට වැඩි | $C_5$ සහ $C_4$ |

04.එබැවින් ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන් සඳහා ප්‍රසම්පාදන වැඩ පිරිනැමීමේදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2016(i) හි සඳහන් මාර්ගෝපදේශ අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

05.මෙම චක්‍රලේඛය මගින් 2016.03.16 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2016 අවලංගු කර ඇති අතර නව චක්‍රලේඛය 2016.09.30 දින සිට බලාත්මක වේ.

මෙම උපදෙස් පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් : 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.

(93)


මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/PMD/Cir/Reg. contracts
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 20.09.2016

Public Finance Circular No: 04/2016(i)

All Secretaries to Ministries
Chief Secretaries of the Provincial Councils
Heads of Departments and District Secretaries
Heads of Local Government Authorities
Government Corporations, Statutory Boards
Chairmen of Government Owned Companies.

**Procurement of Works up to Rs.50 Million from Regional Contractors Under Domestic Funds**

Your kind attention is drawn to the Public Finance Circular No.04/2016 dated 16.03.2016 on the caption "Procurement of Works up to Rs.50 Million from Regional Contractors under Domestic Funds".

02. The government intends to promote contractors in regions by encouraging them to participate in small and medium scale constructions and renovation works of the Government contracts in view of increasing employment opportunities in regions, develop capacity of the regional contractors, reduce income inequality, and minimizes delays in constructions and to utilize local resources at competitive cost within the regions, while maximizing the value for money for the government in construction/renovations in respective regions.

03. Although there are sufficient number of regional contractors who are capable to undertake various construction and renovation projects, it has been reported that such contracts are awarded to the large scale national level contractors. Therefore, government has decided to limit the invitation of bids for construction contracts of small scale with a value up to 50 million within regional contractors under the equivalent CIDA registration Grades mentioned below to ensure that the contractors of each level will be able to participate in constructions of such limits implemented under domestic funds.

| **Total cost estimate** | **CIDA Grade** |
|---|---|
| i) Value below or equal Rs.2,000,000.00 | $C_9$ |
| ii) Value below or equal Rs.5,000,000.00 | $C_8$ |
| iii) Value below or equal Rs.10,000,000.00 and above Rs.5,000,000.00 | $C_7$ |
| iv) Value below or equal Rs.25,000,000.00 and above Rs.10,000,000.00 | $C_6$ and $C_5$ |
| v) Value below or equal Rs.50,000,000.00 and above Rs.25,000,000.00 | $C_5$ and $C_4$ |

04. The administrative boundaries of the word "Regional" is defined as the respective provincial territory. In the event that the bidder is an individual, he/she shall be a resident of the respective province. In the case of a company its registered official address should be within the respective province.

05. When bids are invited (Invitations for Bids), you may insert the method of procurement as follows.

> *"Bidding will be conducted through National Competitive Bidding, however, limited to the bidders who registered within the administrative boundary of the ………………………… province.*

06. The Public Finance Circular No.04/2016 dated 16.03.2016 issued on this regard is hereby cancelled with effect from the date of this circular.

07. Any clarification on issues related to this circular may be obtained from the Director General of Department of Public Finance on Tel:011-2484614.

**R.H.S. Samaratunga**
**Secretary to the Treasury**